දුරකථන ) 0112669192 , 0112675011
njhiyNgrp ) 0112694033 , 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
ngf;]; ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
kpd;dQ;ry; Kfthp )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
,izaj;jsk; )
website )

iqjisrsmdh
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) 06/G/PHMA/OPEN/2026-III
vdJ ,y )
My No. )

ඔබේ අංකය )
ckJ ,y )
Your No. )

දිනය ) 2026.10. 19
jpfjp )
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health & Mass Media

රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021 (2025) පෙනී සිට කුසලතාවය 541 ලැබූ අයදුම්කරුවන් වෙත,

**රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය - තුන්වන කණ්ඩායම**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2025.08.31 දින පවත්වන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021 (2025) ප්‍රතිඵල මත කුසලතා අංක 541 ලැබූ ඇමුණුම 01 හි නම් සඳහන් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2026.10.24 දින පැවැත්වීමට තීරණය කර ඇති බව සතුටින් දන්වමි.

02. ඒ අනුව, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර තනතුරට පත්කිරීම සඳහා එම අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය, **2026.10.24** දින පෙ.ව. **09.30** සිට **අංක 106, ඩබ්ලි සේනානායක මාවත, කොළඹ 08 පිහිටි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නව ගොඩනැගිලි පරිශ්‍රයේදී (කාසල් වීදියේ කාන්තා රෝහල අසල)** පවත්වනු ලබන අතර, ඒ පිළිබඳ ඉහත ඇමුණුම් 01හි නම් සඳහන් එක් එක් අයදුම්කරුවන් වෙත ලියාපදිංචි තැපැල මගින් දැනුම් දීමට කටයුතු සූදානම් කර ඇත.

03. ඉහත ඇමුණුම 01හි නම සඳහන්ව ඇතත්, තැපැල් ප්‍රමාදයන් හෝ වෙනත් හේතුවක් මත එම ලිපිය ඔබ වෙත ලැබී නොමැතිනම් **ඇමුණුම 02** මගින් ඉදිරිපත් කර ඇති කෙටුම්පත් ලිපියෙහි සඳහන් පරිදි අදාල ලිපි ලේඛන/සහතික සමඟ ඔබට නියමිත දිනට සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන ලෙස කාරුණිකව දන්වමි.

04. තවද ඇමුණුම 02 ලිපියෙහි සඳහන් කර ඇති ලිපි ලේඛන/සහතික ඉදිරිපත් කිරීමේ යම් ගැටළුවක් පවතීනම්, ඒ බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබා ගත් ලිපියක් සහ ඔබ විසින් සකස්කරගත් දිවුරුම් ප්‍රකාශයක් සමඟින් ඔබට නියමිත දින සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

05. එමෙන්ම මේ සම්බන්ධයෙන් යම් අපැහැදිලි තොරතුරක් හෝ කිසියම් කාරණයක් ඇත්නම් පහත සඳහන් දුරකථන අංක අමතා වැඩිදුර විස්තර දැන ගැනීමට කටයුතු කරන ලෙසද දන්වමි.

I). ඩී.එම්.එන්. දිසානායක මයා - 0718009776
**අධ්‍යක්ෂ (පාලන) VI**

II). ජේ.ඒ.කේ.ඒ. ධර්මවර්ධන මෙය - 0776611526
**රා.සෞ.ක.ස. (විෂය නිලධාරි)**

ඒ.බී.ඩබ්ලිව්. කුමාරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
ලේකම් වෙනුවට

ඒ.බී.ඩබ්ලිව්. කුමාරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ 10.

දුරකථන ) 0112669192 , 0112675011
njhiyNgrp ) 0112694033 , 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
ngf;|; ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
kpd;dQ;ry; Kfthp )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
,izaj;jsk; )
website )

iqjisrsmdh
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) 06/G/PHMA/OPEN/2026-III
vdJ ,y )
My No. )

ඔබේ අංකය )
ckJ ,y )
Your No. )

දිනය ) 2026.10.
jpfjp )
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health & Mass Media

යොමු අංකය : 06/G/PHMA/OPEN/2026-III

ජා.හැ. අංකය : ..............................
විභාග අංකය : ..............................
ලකුණු සංඛ්‍යාව : ..............................
කුසලතා අංකය : ..............................

.................................... මහතා/මහත්මිය/මෙනවිය

<u>රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය - තුන්වන කණ්ඩායම</u>

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2025.08.31 දින පවත්වන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021 (2025) ප්‍රතිඵල මත පැවැත්වෙන තුන්වන කණ්ඩායම බඳවා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට ඔබ සුදුසුකම් ලබා ඇති බව සතුටින් දන්වමි.

02. ඒ අනුව, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර තනතුරට පත්කිරීම සඳහා ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය (.........) වැනි දින (.........) ට අංක **106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 පිහිටි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නව ගොඩනැගිලි පරිශ්‍රයේදී (කාසල් වීදියේ කාන්තා රෝහල අසල)** පවත්වනු ලැබේ.

03. එදින නියමිත වේලාවට සහභාගී වන ලෙස ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට පහත සඳහන් ලියකියවිලි ද රැගෙන ආ යුතුය.

I. ජාතික හැඳුනුම්පත/වලංගු විදේශ ගමන් බලපත්‍රය/වලංගු රියදුරු බලපත්‍රය හෝ ජාතික හැඳුනුම්පත අළුත් කිරීමට ඉදිරිපත් කර ඇත්නම් ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ QR කේතය.

II. උප්පැන්න සහතිකය. (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් නිකුත් කරන ලද මුල් පිටපත)

III. විභාග අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උපයෝගී කරගත් සියලුම අධ්‍යාපන සහතිකවල මුල් පිටපත්. (අ.පො.ස. සා/පෙළ සහ අ.පො.ස. උ/පෙළ අධ්‍යාපන සහතික ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කළ සහතික විය යුතුය)

IV. පාසල හැරයාමේ සහතිකයේ මුල් පිටපත. (අවසන් වරට අධ්‍යාපනය ලැබූ විද්‍යාලයේ විදුහල්පති විසින් නිකුත් කරන ලද)

V. ඉහත I,II,III හා IV හි සඳහන් ලියකියවිලිවල ඔබ විසින් සත්‍ය පිටපත් ලෙස සහතික කර ගන්නා ලද ඡායා පිටපත්

VI. ඔබ භාවිතා කරන නමේ හා උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතික පත්වල සඳහන් වන නමේ සුළු හෝ වෙනසක් ඇත්නම්, එම වෙනස පැහැදිළි කිරීම සඳහා විධිමත් ආකෘතියකින් යුත් දිවුරුම් ප්‍රකාශයක්. (අදාල සහතිකවල නම් වෙන වෙනම සඳහන් කරමින් එම නම්වලින් සඳහන් වන්නේ එකම පුද්ගලයෙකු බවට ප්‍රකාශ කරමින් අවලංගු නොකරන ලද මුද්දරයක් මත ඔබගේ අත්සන තබා සාමදාන විනිසුරුවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් එය සහතික කළ යුතුය)

VII. ඔබ පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත් පදිංචි සහතිකය (ඩී.එස්.4 ආකෘතිය මගින් විය යුතුය)

04. තවද, මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවූවහොත්, ඔබ පත්වීම ප්‍රතික්ෂේප කරන අයකු ලෙස සළකා කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වමි.

05. පත්වීමක් ලැබීම සඳහා අංක 2,235 හා 2021.07.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද යථෝක්ත විභාග නිවේදනය ප්‍රකාරව, අදාළ තනතුර සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණය, සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවූවක් වන අතර එය පත්වීමක් ලබා ගැනීමට ඔබට අයිතියක් නොවන බවද, මෙම ලිපිය නිකුත් කිරීමෙන් පමණක් ඔබ පත්වීමක් ලැබීමට සුදුසසකු නොවන බවද කාරුණිකව සලකන්න.

අත්./කළේ: විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්

ඩී.එම්.එන්. දිසානායක
අධ්‍යක්ෂ (පාලන) VI